**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2020 , 2021 හා 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වූ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2020 , 2021 හා 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ තුන සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව 2020 හා 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020,2021 හා 2022 යන වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවන් 2023 මාර්තු 24 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | • 2020 - කෙටුම්පත් ගිණුම් වාර්තා සකස් කර ඇත.<br>• 2021 සහ 2022 - පරිගණක පද්ධතිවල ඇති වූ දෝෂයක් මත කෙටුම්පත් ගිණුම් වාර්තා සැකසීමේ ප්‍රමාදයක් සිදුව ඇති අතර, එම පරිගණක දත්ත යාවත්කාලීන කිරීම මේ වනවිට සිදුවෙමින් පවතී. | නොපමාව 2020, 2021 හා 2022 මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යුතුය. |

## 2. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 18 දිනැති පීඊඩී 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | පූර්ණ රාජ්‍ය අයිතිය සහිත සමාගම් විසින් 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේදී 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතු බව චක්‍රලේඛයේ සඳහන් කර තිබුණි. 2019 වර්ෂය සඳහා ගිණුම් විගණකාධිපති වෙත මාස 30 ක් පමණ ප්‍රමාද වී 2022 අගෝස්තු 16 වන දින ගිණුම් ඉදිරිපත් කර තිබුණු අතර එම ගිණුම් විගණනය කිරීමට පෙර චක්‍රලේඛයට පටහැනිව විධායක හා විධායක නොවන නිලධාරීන් 1350 ක් වෙනුවෙන් එක් නිලධාරියකුට රු.15,000 බැගින් 2020 වර්ෂයේදී රු.19,086,375 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි. | මිල්කො ආයතනයේ ප්‍රසාද දීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කිරීමක් සිදු නොකර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව පූර්ණ රාජ්‍ය සමාගම් විසින් 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේදී 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතුය . |
| (ආ) 2021 දෙසැම්බර් 15 දිනැති පීඊඩී 03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2020 විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව 2021 වර්ෂයේ ප්‍රසාද දීමනා ගෙවිය යුතු බව චක්‍රලේඛයේ සඳහන්ව තිබුණි. සමාගම විසින් 2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 30 ක් පමණ ප්‍රමාද වී 2023 අගෝස්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ගිණුම් විගණනය කිරීමට පෙර චක්‍රලේඛයට පටහැනිව 2021 වර්ෂය වෙනුවෙන් සේවකයන් 1356 ක් සඳහා 2021 අප්‍රේල් 09 දින එක් නිලධාරියෙකුට රු.20,000 බැගින් රු.25,921,238 ක්ද 2021 දෙසැම්බර් 21 දින එක් නිලධාරියෙකුට රු.11,657 බැගින් රු.14,800,907 ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි. | මිල්කො ආයතනයේ ප්‍රසාද දීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කිරීමක් සිදු නොකර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව 2020 විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව 2021 වර්ෂයේ ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. |
| (ඇ) 2022 දෙසැම්බර් 21 දිනැති පීඊඩී 09/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | )22 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා ගෙවීමේදී 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව සිදු කළ යුතු අතර 2021 වර්ෂයේ අලාභයක් නම් ප්‍රසාද දීමනා සඳහා හිමිකම් නොමැති බව දක්වා තිබුණි.සමාගම විසින් 2021 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 24 වන විටත් ඉදිරිපත් කර නොතිබියදී හා ආයතනයේ ලාභදායී තත්ත්වය පිළිබඳව තොරතුරු නොමැතිව තිබියදී ප්‍රසාද දීමනා ලැබීමට හිමිකම් නොමැති තත්ත්වයකදීත් 2022 අප්‍රේල් මස 11 වන දින හා 2022 දෙසැම්බර් 23 වන දින එම චක්‍රලේඛයන්ට පටහැනිව එක් නිලධාරියෙකුට රු.10,000 බැගින් පිළිවෙලින් රුපියල් 13,044,888 ක් හා රුපියල්12,719,687 ක් විධායක හා විධායක නොවන සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | මිල්කො ආයතනයේ ප්‍රසාද දීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කිරීමක් සිදු නොකර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා ගෙවීමේදී 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතුය. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර | 2021 හා 2022 වර්ෂයන් ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් හෝ උපාය මාර්ගික සැලැස්මක් විගණිත දිනය වන 2023 පෙබරවාරි 28 | 2020 සහ 2021 වර්ෂවලදී රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් | චක්‍රලේඛය අනුව 2021 හා 2022 වර්ෂයන් ආවරණය |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය , අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛයේ සමග ඉදිරිපත් කළ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය | දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යසන තත්ත්වය සහ අනෙකුත් ව්‍යාකූල තත්ත්වයන් හේතුවෙන් 2021 සහ 2022 වර්ෂයන් සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට හැකියාවක් නොතිබිණි. එහෙත්, ඒ ඒ වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | වන පරිදි සංයුක්ත සැලැස්මක් හෝ උපාය මාර්ගික සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඉ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) ඡේදය | සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු එහි ලැයිස්තු ගත කළ යුතු අතර මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතුය. එසේ වුවද එවැනි කරුණු ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්මක් 2020,2021 හා 2022 වසර යන වසර තුන සඳහාම පිළියෙල කර නොතිබුණි. | මේ වනවිට මෙම කරුණ පිළිබඳව අවධානය යොමුකර ඇති අතර 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘති යටතේ නව යන්ත්‍රාගාරය සවිකිරීමෙන් පසු 2017 වර්ෂයේ ජූලි මසදී නිෂ්පාදනය කළ කිරිපිටි කිලෝග්‍රෑම් 771,652ක් දෝෂ රහිත බවට පරීක්ෂණ වාර්තා නිකුත් කර විකුණුම් කරන ලද අතර පාරිභෝගික පැමිණිලි හේතුවෙන් මිනිස් පරිභෝජනයට නුසුදුසු බැවින් නැවත ගබඩා වෙත ගෙන්වා ගෙන තිබුණි. රුපියල් මිලියන 475.2 ක් වටිනා කිරිපිටි කිලෝග්‍රෑම් 720,000ක ප්‍රමාණයකින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සත්ත්ව ආහාර ලෙස විකිණීමෙන් පසු ඉතිරි කිලෝග්‍රෑම් 561,264 ක් 2022 දෙසැම්බර් 31 දින අඹේවෙල කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි. මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | මිනිස් පරිභෝජනයට නුසුදුසු ඉතිරි කිරිපිටි තොගය ද විකිණීමට කටයුතු කරන ලද අතර, එම තොග ඉවත්කර ගැනීමට කටයුතු කරමින් පවතී. | විනය පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන්ගෙන් පාඩුව අය කර ගතයුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ ) 2020,2021 හා 2022 වර්ෂයන්ගේ සමස්ත නිෂ්පාදනයෙන් සමාගමේ සේවකයින්හට නොමිලේ නිකුත් කරන ලද කිරිපිටි, බටර්, චීස්, එළගිතෙල් හා අනෙකුත් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ විස්තර පහත දක්වා ඇති අතර මේ සඳහා පිළිගත හැකි අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. (වගුව පහත) | මෙම ප්‍රමාණය සේවක මහත්ම/ මහත්මීන් සඳහා තෑගි පාර්සල් ලබාදීම වෙනුවෙන් නිකුත් කර ඇති අතර, කාර්යය මණ්ඩලය වෙත වර්ෂයේ අප්‍රේල් සහ දෙසැම්බර් යන මාසවල තෑගි පාර්සල් ලබාදීම අඛණ්ඩව සිදුවී ඇත. | නීත්‍යානුකූල නොවූ ගනුදෙනු ලෙස සලකා කටයුතු කළ යුතුය. |

| නිෂ්පාදිත වර්ගය | 2022 | | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|---|
| | සමස්ත නිෂ්පාදනය | නොමිලේ නිකුත් කරන ලද ප්‍රමාණය | සමස්ත නිෂ්පාදනය | නොමිලේ නිකුත් කරන ලද ප්‍රමාණය | සමස්ත නිෂ්පාදනය | නොමිලේ නිකුත් කරන ලද ප්‍රමාණය |
| 1.කිරි පිටි (කිලෝ ග්‍රෑම්) | 2,060,294 | 38,992 | 2,806,395 | 42,172.8 | 4,264,012 | 25,849 |
| 2. බටර් (කිලෝ ග්‍රෑම්) | 360,889 | 1,800.35 | 578,372 | 1,525.5 | 726,389 | 892.78 |
| 3.උකුකිරි (ලීටර්) | 739,092 | 3,122.61 | 929,671 | 3,417.21 | 873,749 | 2,155.58 |
| 4.චීස් (කිලෝ ග්‍රෑම්) | 30,666 | 480.51 | 21,666 | 491.8 | 34,151 | 0.8 |
| 5.දියර කිරි (ලීටර්) | 10,331,807 | 11,926.59 | 16,324,547 | 9,011.5 | 14,248,148 | 3,421 |
| 6.එළගිතෙල් (ලීටර්) | 67,342 | 697.65 | 92,802 | 555.65 | 85,258 | 309.35 |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කර්මාන්තශාලාවට 2015 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා ඩීසල් තොග මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිකුත් කර තිබුණු රු.17,209,467ක් වටිනා ඩීසල් ලීටර් 165,300ක් මිල්කෝ ආයතනයේ කර්මාන්තශාලාවේ තෙල් ටැංකි තුළට ගොඩබෑමේ කටයුතු සිදු වී නොතිබුණ බව නිරීක්ෂණය විය. | ඩීසල් තොග අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් පූර්ණ විගණන පරීක්ෂණයකට ලක්කළ අතර, එම වාර්තාව මගින් හෙළිවූ කරුණු අනුව වගකිව යුතුයැයි සැලකෙන නිලධාරීන් වැඩතහනමකට ලක්කර ඉදිරි විනය පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එමෙන්ම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද, පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ සියලු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල කටයුතු කළ යුතු අතර මෙවැනි වංචා වැළැක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ ) 2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා කර්මාන්තශාලාව වෙත ඉන්ධන තොග ලැබීමේ ආරක්ෂක අංශයේ ලේඛන පරීක්ෂාවේදී රු.9,364,835ක් වටිනා ඩීසල් ලීටර් 92,400ක ප්‍රමාණයක් රැගත් බවුසර් රථ 14 ක් කර්මාන්තශාලාව තුළට පැමිණ නොතිබුණු බව නිරීක්ෂණය වුව ද එම ඉන්ධන සඳහා ගෙවීම් සිදුකර තිබුණි. මෙහිදී ඇතැම් තොග සම්බන්ධ ඉන්වොයිස්වල දැක්වෙන අත්සන් ආරක්ෂණ අංශයේ නිලධාරීන්ගේ අත්සන් හා නොසැසඳෙන බව නිරික්ෂණය විය. | ඩීසල් තොග අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් පූර්ණ විගණන පරීක්ෂණයකට ලක්කළ අතර, එම වාර්තාව මගින් හෙළිවූ කරුණු අනුව වගකිව යුතුයැයි සැලකෙන නිලධාරීන් වැඩ තහනමකට ලක්කර ඉදිරි විනය පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එමෙන්ම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද, පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ට විනයානුකූලව පියවර ගත යුතුය. |
| (ඈ ) මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ 2019 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා කර්මාන්තශාලාවේ ඇති විදුලි ජනක යන්ත්‍රය සඳහා ටැංකි වලින් ඩීසල් නිකුත් කිරීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී විදුලි ජනක යන්ත්‍රය සඳහා නිකුත් කර ඇති බවට තොග පොත්වල සඳහන් ප්‍රමාණයන් හා ඉංජිනේරු අංශය විසින් නඩත්තු කර තිබෙන ලේඛනවල ප්‍රමාණයන් අතර ඩීසල් ලීටර් 58,703 ක ප්‍රමාණයක් අස්ථානගතවී තිබුණි. | ඩීසල් තොග අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් පූර්ණ විගණන පරීක්ෂණයකට ලක්කළ අතර, එම වාර්තාව මගින් හෙළිවූ කරුණු අනුව වගකිව යුතුයැයි සැලකෙන නිලධාරීන් වැඩ තහනමකට ලක්කර ඉදිරි විනය පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එමෙන්ම, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද, පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව පියවර ගත යුතු අතර මෙවැනි වංචා හෙළිදරව් වන පරිදි ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| (ඉ) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ඉන්ධන මිලදී ගැනීමේදී හා නිකුත්කිරීමේදී සිදුවී ඇති වංචාවන් අනුව එම ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක ඇති බව නිරීක්ෂණය වන අතර මෙවැනි වංචාවන් වළක්වා ගැනීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම ඉහළ කළමණාකරණයේ වගකීම වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ඉන්ධන තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිතකොට තිබුණු අතර, එම ක්‍රියාවලියෙන් බැහැරව යම් යම් නිලධාරීන් කටයුතු කිරීම මෙම | ඉන්ධන මිලදී ගැනීමේදී හා නිකුත්කිරීමේදී ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වංචාවට හේතුවී ඇත. එහෙයින්, එකී අභ්‍යන්තර පාලන පද්ධතියට අනුව කටයුතු කිරීම නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙළක් යොදා ඇත. | |
| (ඊ) ආයතනය වෙත ගොවීන් කිරි සැපයීම දිරිගැන්වීමේ අරමුණින් 2021 ජනවාරි 08 වන දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව විශාල වශයෙන් කිරි සපයන ගොවීන්ට දැනට දෙනු ලබන දිරිදීමනාව රුපියලකින් වැඩිකර 2021ජනවාරි මස සිට ගෙවීම් කිරීමට තීරණය කර තිබුණි. දිරි දීමනා ගෙවීමට පෙර,2020 වර්ෂයේ හතරවන කාර්තුවේදී මුළු කිරි එකතු කිරීම් ප්‍රමාණය ලීටර් 2,610,040ක් වූ අතර පිළිවෙලින් 2021 වර්ෂයේ හතරවන කාර්තුවේදී එකතු කරන ලද කිරි ප්‍රමාණය ලීටර් 1,755,447ක් හා 2022 වර්ෂයේ හතරවන කාර්තුවේදී එකතුකළ කිරි ප්‍රමාණය ලීටර් 1,789,234ක් විය.ඒ අනුව දිරි දීමනාව ගෙවූ පසුවද කිරි සැපයීමේ වර්ධනයක් නිරීක්ෂණය නොවූ බැවින් ගෙවන ලද දිරිදීමනාව අනාර්ථික වැයක් බවට පත්ව තිබුණි. | ක්ෂේත්‍රයේ පවතින දැඩි තරගකාරීත්වය යටතේ අනෙකුත් ආයතන මිල ගණන් වැඩිකළ අතර, එම තරගකාරීත්වයට මුහුණදීම සඳහා අප සමාගම ද මෙම මිල වැඩිකිරීම සිදුකරන ලදී. එලෙස යම් ප්‍රමාණයකින් හෝ මිල වැඩි නොකළේ නම්, ඒ වනවිට මිල්කෝ ආයතනය වෙත ලැබෙමින් පැවති කිරි ප්‍රමාණයද සීඝ්‍ර ලෙස අඩුවීමේ අවධානමක් පැවතුණි. | කිරි සැපයීම්කරුවන්ට ගෙවන දිරි දීමනාව පිළිබඳ සමාලෝචනයක් සිදුකළ යුතුය. |
| (උ)මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් ලෙස රු.6,065,801,089ක වටිනාකමක් පෙන්නුම් කළ ද ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් කර නොතිබුණු බැවින් සහ නිසි පරිදි නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් සමාගම විසින් පවත්වා නොගන්නා බැවින් ස්ථාවර වත්කම්වල පිරිවැය, පැවැත්ම, ක්ෂය ගණනය කිරීම් සහ ඉවත් කරන ලද වත්කම් වල පිරිවැය ආදියෙහි නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | ආයතනයේ ස්ථාවර වත්කම් ලැයිස්තුව Excel පැතුරුම්පතක නඩත්තු කරන අතර, එහි නිර්වද්‍යතාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් කටයුතු කරමින් පවතී. | වත්කම් භෞතිකව සත්‍යාපනය කර යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් සමාගම විසින් පවත්වා ගත යුතුය. |
| (ඌ) අඹේවෙල කර්මාන්තශාලාවේ 2017 ජූනි මාසයේදී ස්ථාපිත නව යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට ජාතික විදුලිබල සම්බන්ධතාවේ නිතරම සිදුවන විදුලි බිඳවැටීම් හේතුවෙන් බාධක පැමිණීම නිසා වැඩි දියුණු කළ විදුලි පද්ධතිය ක්‍රියාකිරීමට නොහැකි වී ඇත. ඒ හේතුවෙන් එවැනි විදුලි බිඳ වැටීමකදී යන්ත්‍ර වල ක්‍රියාකාරිත්වයට හානියක් නොවීම සඳහා අඛණ්ඩ විදුලි බල සැපයුම් ඒකකයක් සපයා සවිකිරීමට ටෙන්ඩර් කැඳවා තිබුණ ද තෝරාගත් සැපයුම්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පැමිනීමෙන් පසු එය අවලංගු කිරීම නිසා එම සමාගම විසින් මිල්කෝ සමාගමට විරුද්ධව නඩුවක් පවරා තිබුණි. ඉදිරියේදී මේ සඳහා අවිනිශ්චිත වැයක් ඇතිවිය හැකි බවක් මෙන්ම එම සැපයුම් ඒකක මිලදී නොගැනීම නිසා අපේක්ෂිත පරිදි නිෂ්පාදනාගාරයේ කටයුතු සඳහා එම නව | සමාගමට අගතියක් නොවන අයුරින් එකී නඩුව සමථයකට පත්කර ගැනීමටත්, UPS පද්ධතියක් ස්ථාපිත කර ගැනීමටත් කටයුතු සිදුකරමින් පවතී. | අඛණ්ඩ විදුලි බල සැපයුම් ඒකකයක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

විදුලි පද්ධතිය (MV පැනලය) භාවිතා කිරීමට නොහැකි වීම හේතුවෙන් විදුලිබල උත්පාදක යන්ත්‍ර සඳහා අධික පිරිවැයක් දැරීමට ද සිදුවී තිබුණි.

**3.3. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ ) 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමේදී කිරි ආශ්‍රිත නිෂ්පාදන හා කිරි ප්‍රසම්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් 03 ක් සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම ශුන්‍ය මට්ටමක පැවති අතර තවත් ක්‍රියාකාරකම් 13 ක් සම්බන්ධයෙන් ඉලක්ක අත්පත්කරගැනීම සියයට 2 සිට සියයට 69 දක්වා අවම මට්ටමක පැවතුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්කගත වැඩසටහන් බොහෝමයක් සපුරා ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක අත්පත්කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකමක් වන කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය සහ කිරි ප්‍රසම්පාදනය කිරීම යන ක්ෂේත්‍රයේ, කෙටිකාලීන අරමුණු යටතේ 2021 වර්ෂය තුළ වාර්ෂික කිරි එකතු කිරීම ලීටර් මිලියන 96 දක්වා ඉහළ දැමීමත් කිරි ආශ්‍රිත නිෂ්පාදන වලට සම්බන්ධ ගොවීන්ගේ වාර්ෂික සාමාන්‍ය ආදායම සියයට 12 කින් වර්ධනය කිරීමේ අරමුණු ඇතිව කිරි එකතු කිරීමේ ජාලය විකාශනය කිරීම සඳහා වර්ෂය තුළ වැඩසටහන් 13 ක් හඳුනාගෙන තිබුණු අතර උප වැඩසටහන් 34ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.එම ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 424.77 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද සත්‍ය වශයෙන් රුපියල් මිලියන 36.33 ක් වැය කරමින් එනම් ප්‍රතිපාදනයෙන් සියයට 8.6 ක අවම මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන තිබුණු අතර උප වැඩසටහන් 25 කට අදාළව භෞතික ප්‍රගතිය අත්කර ගැනීම් ශුන්‍ය මට්ටමේ සිට සියයට 67 දක්වා අවම මට්ටමක පැවතුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්කගත වැඩසටහන් බොහෝමයක් සපුරා ගැනීමට නොහැකි විය. | කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය සහ කිරි ප්‍රසම්පාදනය ඉලක්ක අත්පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාගමේ අලෙවි හා විකුණුම් අංශය යටතේ වැඩසටහන් 08 ක් සැලසුම් කර තිබුණු අතර ඒ සඳහා රුපියල් මිලියන 48.9 ක් ප්‍රතිපාදනය කර තිබුණු මුත් සත්‍ය පිරිවැය රුපියල් මිලියන 6.7 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 13.7 ක අවම මට්ටමක් විය. වැඩසටහන් 08 න් සමාගමේ අලෙවිසැල් 5ක් හා ප්‍රාදේශීය විකුණුම් අලෙවිසැල් 3ක් පිහිටුවීම සිල්ලර වෙළඳසැල් සඳහා අධිශීතකරණ 300ක් බෙදාහැරීම, යෝගට් හා බටර් ගබඩා කිරීම සඳහා ශීත කාමර 3ක් ඉදිකිරීම යන ක්‍රියාකාරකම් 4 ඉටු වී නොතිබුණු බැවින් ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගයන් වැඩිදියුණු කිරීම සිදුව නොතිබුණි. ඉතිරි ක්‍රියාකාරකම් 4න් අලුතින් බෙදාහරින්නන් 25න් 19ක් ද අලෙවිසැල් 5000න් 1484ක් ද වරලත් අලෙවිසැල් 50න් 88ක් ද , නාමපුවරු 400න් 160ක් බෙදාහැරීම සිදුකර තිබුණු බව දක්වා තිබුණ ද එම ක්‍රියාකාරකම් වල නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා | මින් බොහෝමයක් ප්‍රගතීන් සඳහා සාක්ෂි ලේඛන වෙන වෙනම පිළියෙල කර නොමැති අතර, අවශ්‍යවන්නේ නම් පිළියෙල කර ඉදිරිපත් කළ හැක. | ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාගමේ ක්‍රියාකාරකම් වල නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| පහත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>(i) ලියාපදිංචි නියෝජිතයින් පිළිබඳ විස්තර (නම, ලියාපදිංචි වූ දිනය, ලිපිනය,බැංකු ඇපකර විස්තර, 2021 හා 2022 වර්ෂ වලදී හිඟ විකුණුම් මුදල)<br><br>(ii) 2021, 2022 වර්ෂ වලදී ආරම්භ කරන ලද අලෙවිසැල් පිහිටි ස්ථානය, ආරම්භක දිනය (පෞද්ගලික අංශය හා මිල්කෝ) ,හිඟ විකුණුම්<br><br>(iii) 2020, 2021 වර්ෂ වලදී වරලත් අලෙවිසැල් පිහිටි ස්ථාන, ආරම්භක දිනය (පෞද්ගලික අංශය, මිල්කෝ) හා හිඟ විකුණුම්<br><br>(iv) ප්‍රාදේශිය අලෙවි මධ්‍යස්ථාන පිහිටි ස්ථාන, ආරම්භක දිනය, අයිතිය (පෞද්ගලික අංශය, මිල්කෝ) හා 2020 හා 2021 හිඟ විකුණුම්<br><br>(v) සිල්ලර වෙළඳසැල් පිහිටි ස්ථාන, ආරම්භක දිනය හා අයිතිය,<br><br>(vi) 2021 වර්ෂය තුළ නාම පුවරු බෙදාහැරියේ කාට ද හා බෙදාදුන් දිනයන් | | |
| (ඇ) 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ වූ එක් කලාපයක කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලය සමඟ ජාලගත කිරීම , මානව කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් හා ගොවීන් අතර තරඟකාරිත්වය වර්ධනය කිරීමේ වැඩසටහන යන වැඩසටහන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්කගත වැඩසටහන් බොහෝමයක් සපුරා ගැනීමට නොහැකි වූ අතර, මේ වනවිට මෙම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. | ක්‍රියාකාරී සැලැස්ම තුළ වූ එක් එක් වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021 වර්ෂයේ අමු කිරි එකතු කිරීම ලීටර් 96,551,000 ක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර වර්ෂය තුළ සත්‍ය වශයෙන් කිරි එකතු කිරීමේ ප්‍රමාණය ලීටර් 67,905,259 ක් වූයෙන් ප්‍රගතිය සියයට 70 වූ අතර අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කරගෙන නොතිබුණි. | සමස්තයක් වශයෙන් රටතුළ කිරි නිෂ්පාදනයෙහි අඩුවීමක් පැවතීම හා තරගකාරී ආයතන විසින් තත්ත්ව පිරිවිතර සැලකිල්ලට නොගෙන කිරි එකතු කිරීම හේතුවෙන් මිල්කෝ සමාගමේ කිරි එකතුවෙහි අඩුවීමක් සිදුව ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කරගත යුතුය. |
| (ඊ) 2021 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කොළඹ, දිගන, අඹේවෙල, පොළොන්නරුව යන කිරි කර්මාන්තශාලාවන්වල තොරතුරු තාක්ෂණ අංශයෙහි සැලසුම් ගත ක්‍රියාකාරකම් සඳහා වන භෞතික හා මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්කගත වැඩසටහන් බොහෝමයක් සපුරා ගැනීමට නොහැකි වූ අතර, මේ වනවිට මෙම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. | සැලසුම් ගත ක්‍රියාකාරකම් සඳහා වන භෞතික හා මූල්‍ය ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) සමාගම විසින් 2020 වර්ෂය වෙනුවෙන් මෙහෙයුම් පුරෝකථන වාර්තාව පිළියෙල කර තිබුණ ද 2022 වර්ෂ සඳහා මෙහෙයුම් පුරෝකථන වාර්තාව පිළියෙල කර නොතිබුණු බැවින් ආයතනයේ මෙහෙයුම් ප්‍රගතිය පිළිබඳ ඇගයීමක් සිදු කිරිමට නොහැකිව ඇත. | 2021 වර්ෂය සඳහා මෙහෙයුම් පුරෝකතන සකස් කර ඇති අතර, 2022 වර්ෂයේදී ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම වෙනස් වූ ආකාරයකට සිදුකළ හෙයින් මෙහෙයුම් පුරෝකතන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැත. | සමාගම විසින් මෙහෙයුම් පුරෝකථන වාර්තාව පිළියෙල කළ යුතුය. |
| (ඌ) 2022 වර්ෂය සඳහා ළඟාකර ගත යුතු ප්‍රධාන කාර්යසාධක දර්ශක ස්ථාපිත කර නොතිබිණි. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම වෙනස් වූ ආකාරයකින් සකස් කළ හෙයින් කාර්යය සාධන දර්ශක ස්ථාපිත කර නොමැත. | කාර්යසාධක දර්ශක ස්ථාපිත කළ යුතුය. |
| (එ) සමාගම විසින් 2021 වර්ෂය අවසානයේදී වාර්ෂික අමුකිරි එකතුකිරීම් ප්‍රමාණය ලීටර් මිලියන 96 ක් දක්වා වැඩිකිරීමටත් කිරි කර්මාන්තය ආශ්‍රිත ගොවීන්ගේ වාර්ෂික සාමාන්‍ය ආදායම සියයට 12 කින් ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ඊට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක 14ක් ස්ථාපිත කර තිබුණු අතර ඉහත සඳහන් අරමුණ ඉටුකර ගැනීම උදෙසා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යසාධන දර්ශක 03ක් එනම් අමුකිරි එකතුකිරීම් ප්‍රමාණය වැඩිකිරීම, කිරි කර්මාන්තය සඳහා නව ව්‍යවසායකයින් හඳුන්වාදීම හා නව මෙගා ගොවීන් ඇතිකිරීම යන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සියයට 35 සිට 71 දක්වා වූ අවම මට්ටමක පැවතුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉලක්කගත වැඩසටහන් බොහෝමයක් සපුරා ගැනීමට නොහැකි විය. | ස්ථාපිත කර තිබූ කාර්යසාධක දර්ශක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) 2015 පෙබරවාරි 11 දිනැති අංක අමප/15/0205/631/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඩල්ගම කිරි කර්මාන්තශාලා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු අතර 2015 වසරේදී යූරෝ මිලියන 63.9 ක ආයෝජනයකින් යුතුව ඉදිකිරීම් කටයුතු ඩෙන්මාර්ක් පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට භාරදී තිබුණද 2020 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කළ යුතු ඉදිකිරීම් කටයුතු 2023 පෙබරවාරි වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. එහෙත් 2021 ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළියෙල කිරීමේදී ඉදිකිරීම් කටයුතු සියයට 100 ක් නිම කර ඇති බව දක්වා තිබුණි. | රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හා 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව බුන්වත් බව ප්‍රකාශයට පත් කිරීමත් සමඟ විදේශයන් සඳහා කරන ගෙවීම් මහා භාණ්ඩාගාරය විසින් අත්හිටුවන ලදී. 10%කට ආසන්න ප්‍රමාණයක් තවදුරටත් නිම කිරීම කළ යුතු මට්ටමේ ඇත. | ප්‍රධාන කාර්යසාධක දර්ශක අනුව බඩල්ගම කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුල සම්පූර්ණ කළ යුතුය. |
| (ඔ ) 2021 වර්ෂය වන විට " හයිලන්ඩ් " නිෂ්පාදිත සඳහා වන වෙළඳපොළ කොටස සියයට 25 සිට සියයට 35 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිත බව දක්වා තිබුණු අතර ඊට අදාළව ප්‍රධාන කාර්යසාධක දර්ශක වශයෙන් විකුණුම් ප්‍රමාණය රු.බිලියන 17ක් දක්වා වර්ධනය කිරීම, දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් මිලියන 26ක් දක්වා වර්ධනය කිරීම, පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව 100 දක්වා අඩු කිරීම යනා දී වශයෙන් කාර්යයසාධක දර්ශක ස්ථාපිත කර තිබුණි.ඊට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ. | පිළිතුරු ලබාදී නොමැත | සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම වැඩි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (i). අපේක්ෂිත වෙළඳපොළ කොටස ළඟාකර ගැනීම සඳහා අපේක්ෂිත නිමවුම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ප්‍රධාන යෙදවුම වන කිරි ප්‍රමාණය රටෙහි සමස්ත කිරි නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කරුණක් වුවද සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම 2020, 2021 හා 2022 යන වර්ෂයන්දී පිළිවෙලින් රටතුල සමස්ත දියර කිරි නිෂ්පාදනයන් සියයට 14ක්,13ක් හා 9ක් තරම් පහළ මට්ටමක පැවතුනි. | | |
| (ii) 2020 , 2021 හා 2022 යන වර්ෂ වලදී සත්‍ය දියර කිරි විකුණුම් ප්‍රමාණය පිළිවෙලින් ලීටර් 17,891,573 ලීටර් 20,705,024 ලීටර් 16,012,534ක් විය. දියර කිරි විකුණුම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර වර්තමාන වෙදෙපොළ ප්‍රවණතාවය දියර කිරි පරිභෝජනය වුවත් ඒ පිළිබඳ කළමනාකරණය අවධානය යොමුකර දියර කිරි විකුණුම වැඩිකරගැනීම සඳහා යොමුවී නොතිබුණි. | 2022 වර්ෂයේදී මිල්කෝ සමාගම විසින් එකතු කරන ලද කිරි ප්‍රමාණයේ අඩුවීමක් සිදුවී ඇති හෙයින් දියර කිරි නිෂ්පාදනය ද යම් ප්‍රමාණයකින් අඩු වීමක් සිදුවී ඇත. | දියර කිරි නිෂ්පාදනය වැඩිකරගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (iii) හයිලන්ඩ් නිෂ්පාදන සම්බන්ධයෙන් වන පාරිභෝගික පැමිණිලි ගණන 2020 වසරේ දී 260.ට වඩා අඩු කිරීමටත් 2021 වසරේ 100වඩා අඩු කිරීමට අපේක්ෂා කළ ද 2020 වසරේ පැමිණිලි 798 ක්ද 2021 වසරේ පැමිණිලි 598 ද ලැබී තිබුණු බව විගණනයට ඉදිරිපත් කර තිබුණි.ඒ අනුව සමාගමේ නිෂ්පාදන සම්බන්ධයෙන් පාරිභෝගික නොසතුට වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර ලැබී තිබුණු පැමිණිලි විගණනය වෙත ඉදිරිපත් නොවූ බැවින් ඒ පිළිබඳ විශ්ලේෂණයක් කළ නොහැකි විය. | පාරිභෝගික පැමිණිලි අවම කර ගැනීමේ අරමුණින් කටයුතු සිදු කරනු ලබන අතර, 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී පාරිභෝගික පැමිණිලි අවම කර ගැනීමේ ප්‍රගතියක් ලබා කරගෙන ඇත. | පාරිභෝගික පැමිණිලි ගණන අඩු කිරීමටත් ඒ පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) සමස්තයක් වශයෙන් 2021 වර්ෂය තුළ සමාගම විසින් අපේක්ෂිත කාර්යසාධක දර්ශක 14 අතුරින් දර්ශක 7 ක් එනම් නව කිරි ගොවීන් කර්මාන්තයට හඳුන්වා දීම, නව මෙගා ගොවීන් පිහිටුවීම, දිගන හා පොළොන්නරුව කර්මාන්තශාලාවන්හි ශීත කාමර ඉදිකිරීම, දිගන හා පොළොන්නරුව හා බඩල්ගම කර්මාන්තශාලා සඳහා ISO 22000 ප්‍රමිති සහතිකය ලබාගැනීම, යෝගට් විකුණුම් ප්‍රමාණය කෝප්ප මිලියන 146ක් දක්වා වර්ධනය කිරීම, හයිලන්ඩ් නිෂ්පාදන සහිත වෙළෙඳසැල් ව්‍යාප්ත කිරීම වර්ධනය කිරීම හා සේවක පැමිණිලි අවම කිරීම යන දර්ශක ළඟාකර ගැනීම සැලකිය යුතු අවම මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය වූ අතර කාර්යසාධන දර්ශක ස්ථාපිත කිරීමේදී වඩාත් තාත්ත්වික අන්දමින් ළඟාකර ගත හැකි වන පරිදි පෙර වර්ෂ සමඟ සැසඳීමක් සිදුකර යෝග්‍ය පරිදි ස්ථාපිත කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කාර්යසාධන දර්ශක ස්ථාපිත කිරීමේදී වඩාත් තාත්ත්වික අන්දමින් ස්ථාපිත කළ යුතු ය. |
| (ඔ) 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී කුරුණෑගල, නුවර,අම්පාර සහ ඌව යන ප්‍රාදේශිය කලාප වල අමු කිරි එකතුකිරීමේ ප්‍රගතියෙන් පිළිවෙලින් සියයට 8,16,12, සහ 0.1 ක අඩු වීමක් නිරීක්ෂණය වූ අතර 2021 වසරට | රට තුළ කිරි නිෂ්පාදනය අඩුවීම හා දැඩි තරඟය හේතුවෙන් මිල්කෝ සමාගමෙහි කිරි එකතු කිරීමෙහි අඩුවීමක් පෙන්නුම් | නිෂ්පාදනය වැඩිකර ගැනිමට අමු කිරි එකතුකිරීම වැඩිකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| සාපේක්ෂව 2022 වර්ෂයේ සියලුම ප්‍රාදේශිය කලාප වල අමු කිරි එකතුකිරීම සියයට 53 සිට13දක්වා වූ පරාසයක් තුළ අඩු වීමක් සිදුවී ඇති බව නිරික්ෂණය විය. | කෙරේ. | |
| (ක) සමාගමේ 2020 2021 හා 2022 යන වර්ෂවල නිෂ්පාදයන්ගේ ප්‍රගතිය අනුව 2020 වර්ෂයට සාපේක්ෂ ව 2021 වසරේ චීස්, බටර් හා කිරිපිටි නිෂ්පාදනයේ ප්‍රගතියෙහි පිළිවෙළින් සියයට 3,8 සහ 15 ක අඩුවීමක් නිරික්ෂණය වූ අතර 2021 වසරට සාපේක්ෂව 2022 වර්ෂයේදි පාස්වරිත කිරි හා මීකිරි නිෂ්පාදනයන් හැර අනෙකුත් නිෂ්පාදනයන්ගේ සියයට 64 සිට 15 දක්වා වූ පරාසය තුළ සිඝ්‍ර අඩුවීමක් සිදුවී තිබුණි. | කිරි එකතුවෙහි අඩුවීමට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රගතියේ ද අඩු වීමක් සිදුවී ඇත. | කිරි නිෂ්පාදයන්ගේ ඉල්ලුමත් සමග නිෂ්පාදනය වැඩිකර ගත යුතුය. |
| (කා) කිරි ප්‍රවාහන බවුසර් රථ සම්බන්ධයෙන් කළ පරික්ෂාවේදී LL5724, LL1351 LK1923, LJ4560, LN3801, LK1573 ,LI3915, LN2050 සහ GR1907 යන සමාගම පුද්ගලික අයිතිකරුවන්ගෙන් කුලියට ලබාගෙන තිබුණු බවුසර් රථ සමාගම විසින් සවිකරන ලද ටැංකිය ද සමඟ අයිතිකරුවන් විසින් විකුණා තිබුණි. මෙය ගිවිසුම් උල්ලංඝනය කිරීමක් වන හෙයින් ඒ සම්බන්ධව බවුසර් හිමියන්ට විරුද්ධව නීතිමය පියවරගත යුතු වුවත්එසේ සිදුකර නොතිබුණි. | එම රථවල හිමිකරුවන් විසින් ඒවා වෙනත් පාර්ශවයන් වෙත අලෙවි කළ ද, ටැංකිවල අයිතිය මිල්කො සමාගම සතුවන අතර එම රථ මිලදීගත් නව පාර්ශවකරුවන් විසින් මිල්කෝ සමාගම සමඟ කිරි ප්‍රවාහන කොන්ත්‍රාත්තු පවත්වාගෙන යනු ලබයි. | කොන්දේසි කඩ කිරීම සම්බන්ධව ගිවිසුමේ 31 වගන්තිය පරිදි ගිවිසුම අවලංගු කර වන්දියක් අයකර ගත යුතුය. බවුසරවල නව හිමිකරුවන් සමඟ නැවත ගිවිසුම්ගත විය යුතුය. |
| (කැ) 2020 වර්ෂය තුළදී මිල්කෝ ආයතනයට අයත් කර්මාන්තශාලා 04ම කිරි ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව බවුසර් රථ 71ක් සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුළදී කිරි ලීටර් 46,119,573ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.203,781,417ක පිරිවැයක් බවුසර් රථ සඳහා පමණක් ගෙවා තිබුණි. ඒ අනුව කිරි ලීටරයක සාමාන්‍ය බවුසර් රථ පිරිවැය රු.4.42ක් වී තිබුණු අතර මෙම අධික ප්‍රවාහන වියදම කිරිවල ඒකක පිරිවැය වැඩිවීමට ද බලපා තිබුණ ද ඒ පිළිබඳ ඉහළ කළමනාකරණයෙහි අවධානය යොමුවී නොතිබුණි. | කිරි ලීටරයක ප්‍රවාහන පිරිවැය අවමවන ලෙස ප්‍රවාහනය කිරීම සඳහා ගමන්වාර සැලසුම් කරන අතර, කිරිවල ඒකක පිරිවැය සම්බන්ධයෙන් නිරන්තර අවධානය යොමු කරනු ලැබේ. | ප්‍රවාහන වියදම කිරිවල ඒකක පිරිවැයට ද බලපා න බැවින් එය අයකර ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවා බවුසර් රථ ලබා ගත යුතුය. |

### 3.4 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සමාගමට අයත් කොළඹ කර්මාන්තශාලාව සඳහා 2011 ජනවාරි 20 දින කල්බදු පදනම මත මිලදීගත් රු.104,177,779 ක් වටිනා යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය නිෂ්පාදන දෝෂ නිසා වසර 12 ක කාලයක සිට භාවිතයට නොගෙන ඉවත දමා තිබුණි. | යෝගට් මිශ්‍ර කිරීමේ යන්ත්‍රය භාවිතයට ගත නොහැකි අතර, එහි කොටස් අනෙකුත් කර්මාන්තශාලාවන්හි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන්හි භාවිතයට ගනිමින් පවතී. | නිෂ්පාදන යන්ත්‍රෝපකරණ උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) සමාගමට අයත් දිගන කිරි කර්මාන්තශාලාවේ පවතින රු.9,500,000 ක් පිරිවැය වූ ස්ටිරියලයිස්ඩ් කිරි බෝතල් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය හා කොළඹ කිරි කර්මාන්තශාලාවේ රු.15,445,587ක් වූ අයිස් ක්‍රීම් බඳුන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය පිළිවෙලින් සියයට 46 හා සියයට 71 ක් යනාදී වශයෙන් අවම මට්ටමක ඌන උපයෝජිත තත්ත්වයෙන් පැවතුණි. | යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කිරි තොග ප්‍රමාණවත්ව නොලැබෙන හෙයින්, යන්ත්‍රසූත්‍ර ඌන උපයෝජනය සිදුවේ. | යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය . |
| (iii) අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ පැරණි සහ නව නිෂ්පාදනගාරයන්හි සමස්ත ධාරිතාවය ලීටර් 9,300,000 ක් වුවද 2020,2021 හා 2022 අගෝස්තු දක්වා විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සාමාන්‍ය ධාරිතා උපයෝජනය පිළිවෙලින් ලීටර් 3,052,858 ලීටර් 2,675,819ක් හා ලීටර් 1,690,560 ක් වූ අතර එය මුළු ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 33 ක් ,29 හා 18 ක් තරම් වූ පහළ මට්ටමක පැවතුණි. | යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කිරි තොග ප්‍රමාණවත්ව නොලැබෙන හෙයින්, යන්ත්‍රසූත්‍ර ඌන උපයෝජනය සිදුවේ. | යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම ට කටයුතු කළ යුතුය. |
| (iv) බඩල්ගම කිරි සැකසුම් කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම සඳහා රු.9,932,709,286 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගත වී 2019 දෙසැම්බර් 31 දිනට රු.11,671,726,295 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පැවතුණි. නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර ඇති අඹේවල කර්මාන්තශාලාවට 2019 වර්ෂයේදී දියර කිරි ලැබී තිබුණේ යන්ත්‍ර ධාරිතාවයෙන් සියයට 25කට ප්‍රමාණවත් දියර කිරි පමණි. වර්තමානයේ ඉදිවෙමින් පවතින බඩල්ගම කර්මාන්තලාව නිමවීමෙන් පසු අදාළ කර්මාන්තශාලාවේ යන්ත්‍ර ධාරිතාවයට අනුව දිනකට සමාගමට දියර කිරි ලීටර් 400,000ක් අවශ්‍ය බව වාර්තා කර තිබුණි. වර්තමානයේ අනෙකුත් ක්‍රියාකාරී කර්මාන්තශාලා 04 සඳහා ද ආයතනයට එකතු කළ හැකි දෛනික දියර කිරි ප්‍රමාණය ලීටර් 200,000 ක් පමණ වන බැවින් මෙම යන්ත්‍ර සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. | මේ වනවිට රට තුළ කිරි නිෂ්පාදනයෙහි යම් අඩුවීමක් පැවතිය ද, 2012 සහ 2017 යන වර්ෂයන්හි අපගේ නිෂ්පාදන ධාරිතාවයන් ඉක්මවා කිරි තොග ලැබීම හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉවත දැමීමට සිදුවිය. එකී කරුණු ද මුල්කර ගනිමින් කිරි නිෂ්පාදනයේ නියැලෙන රාජ්‍ය ආයතනය වශයෙන් ගොවීන්ගේ කිරි අස්වනු ඉවත දැමීමකින් තොරව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවා ගැනීමට හැකිවන පරිදි නිෂ්පාදන ධාරිතාවය පවත්වා ගැනීමට සිදුවේ. | යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා වහාම සැලසුම් සකස් කළ යුතුය. |
| (v) පොළොන්නරුව කිරි කර්මාන්තශාලාව පිහිටි අක්කර 12ක ඉඩම හා තවත් අක්කර 37ක් ලෙස ඉඩම් 2ක් සමාගම සතුව පවතී. නමුත් 2019 වර්ෂය අවසන් වන විටත් මෙම ඉඩම් දෙකට අදාළ ඔප්පු හා පිඹුරුපත් සමාගම සතුව නොතිබුණු අතර අක්කර 37 ඉඩමේ ඉදිකර ඇති ක්‍රීඩා සමාජ ශාලාව, කිරිහළ හා ගවගාල දැනට භාවිතා නොකරන බව හා එම ඉඩමෙහි අක්කර 15 අධික භූමි ප්‍රමාණයක් කිසිදු වගාවකට හෝ ඉදිකිරීමකට භාවිතා නොකර නිෂ්කාර්යව පවතින බව 2019 දෙසැම්බර් 31 දින සිදු කළ වාරක පරීක්ෂණයේදී අනාවරණය විය. | ඉඩම් පවරාගැනීමට අදාළ නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවතී. | නිෂ්කාර්යව පවතින ඉඩම් උපයෝජනය කළ යුතුය. ඉඩම්වල නෛතික හිමිකම ලබාගත යුතුය. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මිල්කෝ ආයතනය යටතේ වන කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවල සිට මිල්කෝ කර්මාන්තශාලා සඳහා කිරි ප්‍රවාහනය කිරීමේදී මිල්කෝ ආයතනය සහ කිරි ටැංකි පෞද්ගලික බවුසර් රථ මඟින් ප්‍රවාහනය කර තිබුණි. 2020 වර්ෂය තුළදී පෞද්ගලික බවුසර් රථ 71ක් ප්‍රවාහන කටයුතු වෙනුවෙන් භාවිතා කර ඇති අතර එම රථ වලින් සමාලෝචිත වර්ෂයේදී කිරි ලීටර් 46,119,573ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.203,781,417ක් ගෙවා තිබුණි. මෙම බවුසර් රථ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ආයතනය විසින් ලබාගෙන තිබූ බවත් එම රථ වලින් 45ක ප්‍රමාණයක් වර්ෂ 05කට අධික කාලයක සිට සමාගම විසින් භාවිතා කර තිබූ බවත් නිරීක්ෂණය විය. | එතෙක් තරඟකාරී මිල ගණන් කැඳවා බවුසර් රථ ප්‍රවාහන කොන්ත්‍රාත්තුව ලබාදීම සිදුකළ ද, මිල ගණන් ඉතාමත් ඉහළ අගයක් බව පෙනීගිය හෙයින් මිල සූත්‍රයකට අනුව උපරිම මිලක් තීරණය කිරීමට එවකට සිටි කළමණාකාරිත්වය විසින් තීරණය කරන ලදී. එකී මිල සූත්‍රයට අනුව, මිල ගණන්හි කැපීපෙනෙන අඩුවීමක් සිදුවූ අතර එම ක්‍රමවේදය මේ වනවිට ක්‍රියාත්මක වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කිරි ප්‍රවාහන බවුසර් රථ තෝරා ගත යුතුය. |

### 3.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපළවල ව්‍යාපෘති ආරම්භ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 මාර්තු 10 දින මැනුම් කරන ලද පිඹුරු අංක : 4754 අනුව අඹේවෙල කර්මාන්තශාලාව පවතින රජයට අයිති ඉඩම අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අතර එහි සමාගම විසින් රු. මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම් කර ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය 2022 දෙසැම්බර් 31 දක්වාම සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරාගැනීමට අදාළ නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවතී. | මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.7 වෙනත් ආයතනවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් කර්මාන්තශාලා සහ කාර්යාලවල භාවිතය සඳහා කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයට අයත් ජීප් රථ 2ක් හා ලොරි රථ 02ක් පරිහරණය කළද විගණිත දිනය දක්වාම අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම රථ පැවරීමකින් තොරව ධාවනයේ යෙදවීමට අවසර ලැබී ඇති හෙයින්, ධාවන කටයුතු සඳහා යොදවා ඇත. | වාහන අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.8. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

සමාගමේ 2021,2021 හා 2022 වර්ෂයන් හි අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත කාර්යය මණ්ඩලය 2020 | 2020 තත්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 18 | 19 | - | 01 |
| තෘතියික මට්ටම | 202 | 175 | 27 | - |
| ද්විතික මට්ටම | 873 | 425 | 448 | - |
| ප්‍රාථමික මට්ටම | 485 | 762 | - | 277 |
| | 1578 | 475 | 278 | 1410 |

| සේවක වර්ගය | අනුමත කාර්යය මණ්ඩලය 2021 | 2021 තත්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 80 | 67 | 13 | - |
| තෘතියික මට්ටම | 133 | 139 | - | 06 |
| ද්විතික මට්ටම | 529 | 447 | 82 | - |
| ප්‍රාථමික මට්ටම | 836 | 757 | 79 | - |
| | 1381 | 174 | 174 | 06 |

| සේවක වර්ගය | අනුමත කාර්යය මණ්ඩලය 2022 | 2022 තත්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 80 | 63 | 17 | - |
| තෘතියික මට්ටම | 133 | 135 | - | 02 |
| ද්විතික මට්ටම | 529 | 432 | 97 | - |
| ප්‍රාථමික මට්ටම | 836 | 725 | 111 | - |
| | 1381 | 1355 | 225 | 02 |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2020 වර්ෂයේදී ප්‍රාථමික මට්ටමේ අනුමත තනතුරු ප්‍රමාණය ඉක්මවා සේවකයින් 277ක් සිටියදීත් ප්‍රාථමික මට්ටමේ 2020 වර්ෂය සඳහා නඩත්තු හා කාර්මික නිලධාරී තනතුර සඳහා වැඩ බැලීමේ පත්වීම් 06 ක් ලබා දී තිබුණි. | සමස්තයක් වශයෙන් යම් යම් තනතුරු කාණ්ඩවල අතිරික්ත පැවතිය ද, තනතුරු වශයෙන් ගත්කළ පුරප්පාඩු නිර්මාණය වේ. එහිදී, එකී නිශ්චිත තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. | නොපමාව පුරප්පාඩු පිරවිය යුතුය. අතිරික්ත සේවකයින් තබා නොගත යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2021 වර්ෂයේදී ප්‍රාථමික මට්ටමේ සේවකයන් 79 ක් පුරප්පාඩුව පැවතිය ද ප්‍රාථමික මට්ටමේ තනතුරු වන වැඩබිම් ක්‍රියාකරු තනතුරු 8 ක් හා ජල පොම්ප ක්‍රියාකරු වෙනුවෙන් වැඩ බැලීම් යන මුළු තනතුරු 09 ක් සඳහා වැඩ බැලීම් පත්වීම් ලබා දී තිබුණු අතර ඒ සඳහා 2021 හා 2022වර්ෂයන් තුළ රුපියල් 87,160ක් වැඩබැලීම් දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි. | යම් යම් තනතුරු කාණ්ඩවල පුරප්පාඩු පැවතිය ද, එම අවස්ථාව වනවිට අත්‍යාවශයෙන්ම සම්පූර්ණ කළයුතු පුරප්පාඩු පමණක් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව පුරප්පාඩු පිරවිය යුතුය. අතිරික්ත සේවකයයින් තබා නොගත යුතුය. |
| (iii) මිල්කෝ ආයතනයේ සහකාර කළමණාකාර තනතුරු වෙනුවෙන් බාහිර අයදුම්කරුවන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් ලෙස අදාළ විෂය සම්බන්ධයෙන් උපාධියක් ද අභ්‍යන්තර අයදුම්කරුවන් වෙනුවෙන් අවම අධ්‍යාපන සුදුසුකම් ලෙස අදාළ විෂය සම්බන්ධයෙන් ඩිප්ලෝමාවක් සමග අදාළ සේවා කාලයක් පැවතිය යුතු බව ආයතනයේ එක් එක් තනතුරු වෙනුවෙන් බඳවාගැනීමේ පරිපාටිය තුළ දක්වා තිබුණු නමුත් එම අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් , සහකාර කළමණාකරුවන් ලෙස බඳවාගෙන තිබුණු අවස්ථා 07ක් විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෑත කාලීනව එවැනි බඳවාගැනීම් සිදුවී නොමැති අතර, අතීතයේදී එවැනි දෑ සිදුවී ඇත. | සුදුසුකම් නොමැති අයදුම්කරුවන් බඳවාගත් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. සිදුව ඇති වරද නිවැරදි කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සැලසුම් කිරීම**

**(අ) ව්‍යාපාර සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිරි එකතු කිරීමේ ජාලය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2020 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ගොවි කළමනාකරණ සමිති පිහිටුවීම, සිසිලන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සහ දිනකට ලීටර් 100ක් එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම යන ඉලක්කයන් ව්‍යාපාර සැලැස්මෙහි ඉලක්කයන් සමඟ පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී 2018-2020 ව්‍යාපාර සැලැස්ම යම්තාක් දුරකට පාදක කරගත්ත ද, ඒ වනවිට ව්‍යාපාර ක්ෂේත්‍රයේ පැවති වෙනස්වීම් සහ තරගකාරී වාතාවරණය තුළ ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කයන් සිදුවිය. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ව්‍යාපාර සැලැස්ම පිළිබඳ අවධානයක් යොමු කළ යුතුය. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(II) වගන්තිය ප්‍රකාරව 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වියයුතු වාර්ෂික අයවැය ලේඛනය, මානව සම්පත් සංවර්ධන සැලැස්ම , අභ්‍යන්තර විගණන සැලැස්ම , වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ ණය ආපසුගෙවීමේ | මිල්කෝ සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම වෙනම ද, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, ප්‍රාග්ධන වියදම් සැලැස්ම, පුනරාවර්තන වියදම් සැලැස්ම යන ලේඛන වෙන වෙනමද සකස් කිරීම සිදුවේ. | චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| සැලැස්ම යන තොරතුරු ඇතුළත් වී නොතිබුණු අතර එක් එක් අංශයෙහි ඉලක්කගත වැඩසටහන් පිළිබඳව පමණක් තොරතුරු ඇතුළත් කර තිබුණි.තවද 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් විගණිත දිනය වන 2023 පෙබරවාරි 28 දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එමෙන්ම, මෙකී සැලසුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කළ පසු ලබාදීම සිදුවේ. | |

**4.2 විගණන කමිටු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය සහ 2021 නොවැම්බර් 16 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සෑම මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවද 2022 වර්ෂයේ මුල් කාර්තු 02 ආවරණය වන පරිදි රැස්වීම් පවත්වා නොතිබුණි. | 2020 වර්ෂයේදී රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට හැකියාවක් නොතිබූ අතර, 2022 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් පත් කිරීම ප්‍රමාදවී ඇත. | චක්‍රලේඛය පරිදි සෑම කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතුය. |

**4.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය සහ 2021 නොවැම්බර් 16 දිනැති 1/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2020 හා 2021 යන වර්ෂවලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රැස්වීම් 12ක් පැවැත්විය යුතු නමුත් මෙම වර්ෂවල පිළිවෙලින් රැස්වීම් 06 ක් හා 05ක් පමණක් පවත්වා තිබුණි. | 2020 සහ 2021 වර්ෂවලදී කොරෝනා වසංගත තත්ත්වය රට තුළ පැවති හෙයින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිසි පරිදි පැවැත්වීමට හැකියාවක් නොපැවතිණි. | චක්‍රලේඛය පරිදි මසකට එක් වතාවක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් පැවැත්විය යුතුය . |

**4.4 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ඡේදය ප්‍රකාරව 2020,2021 හා 2022 වර්ෂ සඳහා අයවැය ලේඛන සකස් කර ඉදිරිපත් කර නොතිබුණි . | 2022 වර්ෂය සඳහා අවසන් අයවැය ලේඛනය සකස් කර ඇති අතර එය ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන අයවැය ලේඛනය වර්ෂය ආරම්භ වීමට දින 15 කට නොවැඩි කාලයක් තුළ ඉදිරිපත් කළ යුතුය . |

## 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2023 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සාමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂණ සැලැස්ම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, සමාගම විසින් ඊට ගැළපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ද හඳුනාගෙන නොතිබුණි. | මිල්කෝ ආයතනයේ කාර්යභාරය කිරි ගොවීන්ගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීම සහ ජනතාවට පෝෂදායී ආහාරපාන සැපයීම වේ. ඒ අනුව, අප සමාගම තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා සියලු කාර්යයන් පෙළගස්වා ඇත. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය . |